# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
## 2011 අප්‍රේල් / මැයි

## මානවශාස්ත්‍ර පීඨය

## සිංහල - SINH E1025

## චිරන්තන සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය

**<u>පළමුවන ප්‍රශ්නය ද, දෙවන තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

### <u>1 කොටස</u>

01. අ) පහත දැක්වෙන ඡේදය ලිහිල් බසින් ලියා ඊට අදාළ අවස්ථා සම්බන්ධය දක්වන්න.

ඒ සේනකයන් කිය හෙන උත්තරයක් නැති කල්හි, ගැඹුරු මහ වතුරක් එක පැහැර නමන්නක්හු මෙන් ද, ආකාශ ගංගාව පොළෝ තලයට බහන්නක්හු මෙන් ද මහ බෝසතාණන් වහන්සේ මත්තේ ප්‍රඥා වර්ණනා කරන සේක්, ගාථාවෙකින්, ''ඒකාන්තයෙන් බුදු පසේ බුදු මහ රහතන් ආදි වූ නුවණැත්තවුන් විසින්, 'නුවණ උතුමැ'යි පසස්නා ලද. යම් හෙයකින් නුවණ නැති මිනිස්සු සම්පතෙහි ඇලුණා වූ නම් එ හෙයින් ඔහු 'ශ්‍රී කාන්තාව උතුමැ' යි කියති. මෙ ලොව පර ලොව දන්නා නුවණින් වැඩී සිටියනට මේ යසස් නම් ගැරැවිල් කුණක් හා සමාන ය. ප්‍රඥාව අසදෘශ වූ ස්වරූප ඇත්තී ය. එ සේ හෙයින් මහා සාගරයට වෙරළ ඉක්ම ගත නොහෙන්නා සේ ශ්‍රී කාන්තා තොමෝ කිසි කලෙකත් ඥානවන්තයා ඉක්ම ගත නොහෙන්නී ය, දේවයන් වහන්සැ'' යි වදාළ සේක. ඒ අසා රජ්ජුරුවෝ මහ බෝසතාණන් වහන්සේ ගේ ප්‍රශ්න විසර්ජනයෙන් සතුටු වැ, ''බුදු කෙනකුන් පරිද්දෙන් අපට විසඳා කිව. ඒ තොප ගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි සතුටු වූ මම ගෙරි දහසක් ද, නැඟෙන්නට උතුම් හස්ත්‍යාලංකාරයෙන් සරහන ලද්දා වූ සුශික්ෂිත හස්ති රාජයෙක් ද, අජානේය අසුන් යොදන ලද රථාලංකාරයෙන් සරහන ලද රථ දහසක් ද, ධන ධාන්‍යයෙන් සමෘද්ධ වූ එකෙකි ගමින් හවුරුද්දකට ලක්ෂයක් බැගින් අය තිමන ගම් සොළොසක් ද, යන මෙ කී වස්තූන් තොපට උපකාර කොට දෙමි'' කියා සියල්ල දෙවූ හ.

ආ) පහත දැක්වෙන පද්‍ය පන්තියේ අදහස ලිහිල් බසින් ලියා රසාස්වාදය කරන්න.

ඇ ද ගෙ න සිහිල් මඳනල දියදහර හෙ ත
වි ල ඟ න බියෙන් දිලිනිලුපුල් ඇස්වස ත
අ සු ව න සලෙළුවන් මෙන් පරඟනන් වෙ ත
හැ කි ළෙ න පියුම් ගැබ බමරුන් බැස බැදෙ ත

හිම කර සිනිඳු සොමිරැස් රැස් කරනු ව ට
නිල ඹර කෙතෙයි ඉසි බිජුවට නිසි ලෙස ට
එක වර දිලෙන දිගු දළුලන ලෙස රුව ට
ම මිතුර පෙනෙයි බබළන තරුවැල ද ත ට

ම ඳ නල සබඳ සඳවෙල ගිනිදූල් නො ම ඳ
වැ ද වැඳ පිපිර හුණු තුරුබිජු මෙන් එස ඳ
රො ද බැඳ රොනැර ගෙන යන බමර මුළු වැ ද
කො ඳ වන පිපෙන රඟ බල හැම තැන සබ ඳ

ලොලව වන දනන් ලේ බීමෙන් නොම ඳ
ර තු ව ගියේ දෝ සත සැක කරන ල ද
ම තු ව උදා සිරසින් පෙනෙන එම ස ඳ
බ ල ව සඳ වෙලෙන් රතු වූ සුපුන් ස ඳ

නව යොවුන න් වුවනට කිපි සිසිර ක ර
උන හිමිය න් වෙන් වන තැන දූන වස ර
මත කොවුල න් වෙත ලන රහස යවිදු ර

## <u>II කොටස</u>

02. <u>උම්මග්ග ජාතකයේ</u> පතාකා වස්තුවලින් ප්‍රධාන කථා පුවතට ලැබෙන ආලෝකය පිළිබඳ විමසීමක් කරන්න.

03. "සිංහල සන්දේශාවලියෙහි <u>හංස සන්දේශයට</u> හිමි වන්නේ අද්විතීය ස්ථානයකි." මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

04. ගම්පොළ සාහිත්‍ය යුගයේ සංකීර්ණත්වය පහදන්න.

05. කෝට්ටේ යුගයේ සාහිත්‍ය නිර්මාණවල විවිධත්වය පිළිබඳ විමර්ශනයක් කරන්න.

06. "මහනුවර යුගයේ සිංහල සාහිත්‍යයෙහි සංඛ්‍යාත්මක වර්ධනයක් මිස ගුණාත්මක වර්ධනයක් විද්‍යමාන නොවේ." මේ මතයට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

## <u>III කොටස</u>

07. භාෂාව යනු කුමක්ද' යි විස්තර කොට එහි කාර්ය භාරය පිළිබඳ විමසීමක් කරන්න.

08. සමකාලීන සාමාන්‍ය ජන ප්‍රයෝගානුකූල භාෂා ව්‍යවහාරයේදී භාවිත සිංහල ශබ්ද (අක්ෂර) මාලාව, සාම්ප්‍රදායික ඡේක ප්‍රයෝගානුකූල භාෂා ව්‍යවහාරයේදී භාවිත වන අක්ෂර මාලාවෙන් වෙනස් වන ආකාරය පහදන්න.

09. 'භාෂාව සංස්කෘතියේ එක් අංගයක් නොව මූලිකාංගයකි.' විමසන්න.

10. පහත සඳහන් මාතෘකාවලින් <u>**හතරක්**</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. පූර්ව නාසික්‍ය ව්‍යංජන
2. නෛපාතික ක්‍රියා
3. අභ්‍යන්තර සන්ධි හා බාහිර සන්ධි
4. ෂට් කාරක
5. ස්පර්ශ නාසික්‍ය අක්ෂර හා අස්පර්ශ නාසික්‍ය අක්ෂර
6. උච්චාරණ ස්ථාන හා කරණ
7. සමාජීය උප භාෂා හා පරිමිත භාෂා
8. සන්ධ්‍යක්ෂර
9. කණ්ඨජ අක්ෂර
10. අනමයා දේශය

*****************************